**ශීර්ෂය 405- විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය**

------------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 29 දින ගණකාධිකාරී... ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 20 දින ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ දී ආරම්භ වූ බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මෙම මූල්‍ය වාර්තා ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව මට ප්‍රකාශ කළ නොහැක.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**(අ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශය විසින් මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.453,423ක් වැය කර තිබුණ ද මූල්‍ය ප්‍රකාශයේ කාර්යාල උපකරණ මිලදී ගැනීම රු.183,923ක් ලෙස දක්වා තිබුණෙන් රු.269,500ක් වැයකර මිලදීගෙන තිබුණු කැමරාව, මූලධන වත්කමක් ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ මිලදි ගෙන තිබූ කැමරාව **CIGAS** මෘදුකාංගය මගින් ගිණුම් ගත කිරීමේදී සිදුවූ ප්‍රමාද දෝෂයකින් වත්කමක් ලෙස ගිණුම්ගත නොවී තිබීම 2021 වර්ෂයේ නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇති බව. | මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් මූලධන වත්කමක් ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වේ. |

## 1.6.2 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල්රෙගුලාසි 272(3) ප්‍රකාරව සියලුම ගෙවීම් වවුචර අදාල මාසය අවසානයේ සිට සති 6කට නොවැඩි කාලයක් ඉකුත්වීමට මත්තෙන් විගණකාධිපති වෙත මසක් පාසා එවිය යුතු වුවද ධීවර වරාය, නැංගුරම්පළවල් සංවර්ධන ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති 04ක රු. 804,462,191ක වියදමට අදාල ගෙවීම් වවුචර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබු බැවින් එම වියදම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | ගෙවීම් වවුචර් දැනට ධීවර අමාත්‍යාංශය සතුව ඇති බව. | මුදල් රෙගුලාසි 272(3) ප්‍රකාරව සියලුම ගෙවීම් වවුචර නියමිත කාලපරිච්ඡේද තුලදී විගණනයට ලබාදීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් ශේෂය රු.197,226,919ක් වූ අතර එයින් වර්ෂ 1ත් වර්ෂ 2ත් අතර රු.76,219,097ක්වූ තැන්පතු ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගැනීම සඳහා ඊට අදාල තැන්පතු ලේඛනය හෝ කේවල ශේෂ ලැයිස්තුවක් විගණනයට ඉදිරිපත් නොවීය. | ගිණුම් චක්‍රලේඛ 249-2016 (i) ප්‍රකාරව,පොදු තැම්පතු ගිණුමේ කාල විශ්ලේෂණ වාර්ථාවට ලබා දී තිබූ ආකෘති iii ප්‍රකාරව එය සකස් කර ඉදිරිපත් කර ඇත. වර්ෂ 2 කට වඩා වැඩි ශේෂයන් සඳහා ශේෂ ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු කර ඇති බව. | තැන්පතු ශේෂයට අදාල විස්තර, තැන්පතු ලේඛනය අනුව හෝ කේවල ශේෂ ලැයිස්තුවක් මඟින් හෝ විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය අමාත්‍යාංශය ධීවර වරාය, නැංගුරම්පළවල් සංවර්ධන ව්‍යාපෘතියට හා කලපු සංවර්ධන ව්‍යාපෘතියට අදාල බැංකු ගිණුම් 03හි අග්‍රිම මාරු කිරීම සම්බන්ධ ගෙවීම්වලට හා ලැබීම්වලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුව තිබුණු එකතුව රු.2,908,690ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමකින් තොරව වරාය සංවර්ධන ව්‍යාපෘතියේ බැංකු ගිණුමට මාරු කර තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ නොවන බව හා දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අග්‍රිම නිසි පරිදි පියවා ඇති බව. | වර්ෂ අවසාන ඉතිරි මුදල් ශේෂයෙන් චෙක්පත් නිකුත් නොකර භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පර්යේෂණ හා සංවර්ධන කාර්යය යටතේ නිශ්චිත කාර්යයක් සඳහා මූලධන වියදම් දැරීමට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (**NARA**) වෙත වෙන් කරන ලද රු.7,773,000ක මුදල එම ආයතනයේ ප්‍රාග්ධන වියදම් දැරීමට මාරු කිරීම සඳහා යොදා ගෙන තිබුණි. එම නියෝජිතායතනයේ පර්යේෂණ ක්‍රියාවලි සඳහා අරමුදල් උපයෝජනය සියයට 64.5ක් වූ බැවින් අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවලට සාපේක්ෂව පර්යේෂණ කටයුතු සඳහා අරමුදල් යෙදවීම අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් 3.4% ක ප්‍රතිපාදන ප්‍රමාණයක්, කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පර්යේෂණ කටයුතු අපේක්ෂිත පරිදි ඉටු කිරීමට නොහැකි වීම නිසා ඉතිරි වීමක් සිදු වී තිබුණි. එම නිසා ශ්‍රී ලංකා ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරියේ අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත ප්‍රතිපාදන මාරු කිරීමක් සිදුකර ඇති බව. | පර්යේෂණ කටයුතු සඳහා ප්‍රතිපාදනය කළ අරමුදල් ඒ සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 07 කට අදාල එකතුව රු.1,580,000ක් හා මූලධන වැය විෂයයන් 04 කට අදාල එකතුව රු.1,170,000 ක් වශයෙන් මුළු එකතුව රු.2,750,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වය, තනතුරු පුරප්පාඩුව පැවතිම, ධීවර අමාත්‍යාංශය විසින් වියදම් දැරීම නිසා මෙම තත්වය පැණ නැගී තිබුණු බව. | ඇස්තමේන්තු සකස් කිරීමේ දී අධි ප්‍රතිපාදන සලසා නොගත යුතු වේ. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් ඉදිරිපත් කළ බැරකම් ලේඛනය අනුව වැය විෂයයන් 2ක් සඳහා වාර්ෂික ප්‍රතිපාදිත මුදලින් ඉතිරි වූ රු.95,000ක ප්‍රමාණය ඉක්මවා රු.15,006,102ක බැරකම් හා බැදීම් ඇති කරගෙන තිබුණු අතර වාර්ෂික ප්‍රතිපාදන සලසා නොතිබුණු අංක 151-2-3-71-2506 දරණ වැය විෂයය වෙනුවෙන් රු.756,067ක බැරකමක් ද ඇතිකරගෙන තිබුණි. | අංක 151-2-3-71-2506 දරන මෙම අමාත්‍යාංශයට අදාල වැය ශීර්ෂයක් නොවන බව හා මෙම බැරකම් දැනට වැඩ ආරම්භ කර අවසන් නොවූ ව්‍යාපෘති සඳහා බව. | ඒ ඒ වැය විෂයයන් සඳහා වෙන්කළ මුදල ඇතුළත වියදම් දැරීමට කටයුතු කළ යුතු අතර ආයතනයට අදාළ නොවන වැය විෂයයන් සඳහා බැරකම්වලට නොඑළඹිය යුතු වේ. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොසිටිම හේතුවෙන්, විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අපහසු විය. නමුත් වර්තමානයේ විධිමත් පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරමින් පවතින අතර එහි සමාලෝචනයන් සිදුකර පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය අමාත්‍යාශය වෙත 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබුණු භාණ්ඩාගාර අක්මුදල වූ රු.1,049,700,000 න් රු.1,034,400,000 ක් එනම් සියයට 98.5ක් රාජ්‍ය ආයතන 2ක් හා ව්‍යාපෘති 2 ක් වෙත බෙදාහැර තිබුණු අතර සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 8ක් ඉටු කිරීමට මෙම රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවා තිබුණ ද ඒ පිළිබඳව නොසළකා වර්ෂ ගණනාවක සිට පවත්වාගෙන එන ව්‍යාපෘතිවලට මුදල් යෙදවීම පමණක් සිදු කර තිබුණි. | අංක 2020.08.09 දින දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ හඳුනාගෙන ඇති සුවිශේෂ ප්‍රමුඛතා බොහොමයක්ම අදාල ව්‍යාපෘති දෙකෙහි හා ජලජීවි වගා සංවර්ධන අධිකාරිය හා නාරා ආයතනය යන දෙකෙහි ක්‍රියාකාරකම් මගින් ආවරණය වී තිබුණු බව. | සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් ඉලක්ක කරගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් මස අවසන්වීමට නියමිත වෙල්ලමංකර ධීවර වරාය ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.1,720,100,000ක් එනම් සියයට 70ක් වී තිබුණු අතර භෞතික ප්‍රගතියද සතුටුදායක නොවීය. | 2020 වර්ෂාවසානයේ නිම කිරීමට සැලසුම් කළ මෙම සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමට 2020 මාර්තු මස සිට මැයි මස දක්වා පැවති කෝවිඩ් 19 වසංගත තත්වය, දිවයින පුරා බල පැවැත්වෙන පරිදි ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම, ඇඳිරි නීතිය හා හුදෙකලා කිරීමේ තත්වයන් , යන කරුණු හේතු වූ බව . | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | රාජ්‍ය අමාත්‍යාංශයට වෙන්කළ ප්‍රතිපාදනවලින් සියයට 97කට සමාන රු.260,097,285 ක් ජාතික ජලජීවී සංවර්ධන අධිකාරියේ **(NAQDA)** සංවර්ධන ව්‍යාපෘති 05කට වැයකර තිබුණ ද එම අරමුදල් අදාල කාර්යයන්වලට යෙදවීම පිළිබඳ පසු පරීක්ෂා කිරීමක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. | 2020 අගෝස්තු මාසයේදී මෙම අමාත්‍යාංශය අලුතින් ඇති කල අතර අවශ්‍ය කාර්ය මණ්ඩලය එම කාලපරිච්ඡේදය තුල සම්පූර්ණ වී නොතිබුණු බව හා සියළු අධීක්ෂණය කිරීමේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය නිළධාරීන් නොසිටිම නිසා මවිසින් පෞද්ගලිකව විමසුමේ සඳහන් ආයතනවල කාර්යය භාරයන් හැකි පමණ අධීක්ෂණය කරන ලද බව. | ව්‍යාපෘතිවලට වැයකළ අරමුදල් අදාල කාර්යයන්වලට යෙදවීම සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත් පසුවිපරම් කටයුතුත් කළ යුතු වේ. |
| (ආ) | ඉහත ප්‍රතිපාදනවලට අමතරව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සඳහා සංවර්ධන මූලධන වෙන්කිරීම් යටතේ රු.203,973,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබුණ ද ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව මෙම ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 29 ක් සඳහා රු. 196,200,000ක් පමණක් එම ආයතනය වැය කර තිබුණි. සිදු කරනු ලබන කාර්යයන් හා ප්‍රතිලාභ ලබන්නන් කවරේ ද යන්න සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීම සඳහා ගොනුවක් නඩත්තු කර නොතිබූ අතර අදාල මුදල් නියමිත සංවර්ධන කාර්යයටම යොදවා තිබුණේ ද යන්න පිළිබඳව පසුවිපරමක් සිදු කර තිබුණු බවක් ද නිරීක්ෂණය නොවීය. | -එම- | ව්‍යාපෘතිවලට වැයකළ අරමුදල් අදාල කාර්යයන්වලට යෙදවීම සහ ප්‍රතිලාභ ලබන්නන් පිළිබඳ විස්තර හා ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගෙන පසුවිපරම් කටයුතුත් කළ යුතු වේ. |